# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| --- | --- |
| දිනය | 2023.12.27 |


## පළාත් දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.)[1] - 2022

### ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරීත්වය සඳහා බස්නාහිර, වයඹ සහ මධ්‍යම පළාත් 2022 වසරේ දී ද ප්‍රමුඛ දායකත්වය ලබා දී ඇත.

ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු සඳහා ලබා දෙන දායකත්වය වඩාත් සවිමත් කරගනිමින්, බස්නාහිර පළාත විසින් නාමික ද.දේ.නි. සඳහා දක්වන දායකත්වය 2022 වසරේ දී සියයට 43.4ක් දක්වා ඉහළ නංවා ගැනීමට සමත් විය. බස්නාහිර පළාතේ මෙම ඉහළ දායකත්වය බොහෝ ආර්ථික කටයුතු තුළින් දක්නට ලැබුණු අතර, සේවා සහ කර්මාන්ත අංශ තුළ විශේෂයෙන් කැපී පෙනුණි. තවද, සමස්ත ද.දේ.නි. සඳහා දෙවන සහ තෙවන ඉහළම දායකත්වයන් අනුපිළිවෙළින් වයඹ (සියයට 11.2) සහ මධ්‍යම (සියයට 10.0) පළාත් විසින් ලබාදෙන ලදී.

නාමික. ද.දේ.නි.ට බස්නාහිර, වයඹ සහ ඌව පළාත්වලින් දක්වන ලද දායකත්ව 2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී ඉහළ ගොස් ඇති අතර, උතුරු මැද පළාතෙන් ලැබුණු දායකත්වය නොවෙනස්ව පැවතුණි. මේ අතර, ප්‍රධාන වශයෙන් මිල මට්ටම් ශීඝ්‍ර ලෙස ඉහළ යාම හේතුවෙන් 2022 වසර තුළදී සියළුම පළාත්වල නාමික ද.දේ.නි. සැළකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

| විශේෂ කරුණු | |
| --- | --- |
| *නාමික ද.දේ.නි. – 2022* | |
| *රු. බිලියන 24, 148* | |
| *ප.ද.දේ.නි. දායකත්වය:* | |
| *පළමු* | බස්නාහිර පළාත **43.4%** |
| *දෙවන* | වයඹ පළාත **11.2%** |
| *තෙවන* | මධ්‍යම පළාත **10.0%** |

**රූප සටහන 1**
**පළාත් අනුව ද.දේ.නි. දායකත්වය (%) 2022**




### ආර්ථික කටයුතු සඳහා පළාත් මගින් දායකත්වය[2]

පළාත් වශයෙන් ආර්ථික කටයුතු සඳහා දැක්වූ දායකත්වය සලකා බැලීමේ දී, කෘෂිකර්මාන්තය සඳහා ඉහළම දායකත්වය වයඹ පළාත (සියයට 18.3) විසින් ලබා දී ඇති අතර, දකුණු (සියයට 14.6) සහ මධ්‍යම (සියයට 13.7) පළාත් පිළිවෙළින් දෙවන සහ තෙවන ඉහළම දායකත්ව ලබා දී ඇත.

කර්මාන්ත කටයුතු සඳහා ප්‍රමුඛ දායකත්වය බස්නාහිර පළාත (සියයට 49.2) විසින් වාර්තා කර ඇති අතර, පිළිවෙළින්, වයඹ (සියයට 11.8) සහ මධ්‍යම (සියයට 9.1) පළාත් විසින් දෙවන සහ තෙවන ඉහළම දායකත්ව වාර්තා කරන ලදී.

සේවා අංශයේ ක්‍රියාකාරීත්වය සලකන විට, බස්නාහිර පළාත සිය ප්‍රමුඛතාව 2022 වසරේදී ද රඳවාගනිමින් සියයට 45.2ක දායකත්වයක් වාර්තා කර ඇති අතර, මධ්‍යම පළාත සියයට 10.0ක දායකත්වයක් සහ වයඹ පළාත සියයට 9.8ක දායකත්වයක් වාර්තා කරමින්, පිළිවෙළින්, දෙවන සහ තෙවන ස්ථානවල රැඳී සිටියි.

**රූප සටහන 2**
**පළාත් අනුව ආර්ථික කටයුතුවල ප්‍රතිශත දායකත්වය - 2022**




[1] 2015 පදනම් වර්ෂය යටතේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද නාමික දළ දේශීය නිෂ්පාදිතය පළාත් අනුව බෙදා වෙන්කර ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ප.ද.දේ.නි. ඇස්තමේන්තු කර ඇත. මෙහිදී ද.දේ.නි. හා සම්බන්ධ එක් එක් අයිතමවල අගයන් පළාත් මට්ටමෙන් සකස්කරගත් දර්ශක පදනම්කොට එක් එක් පළාත් සඳහා බෙදා හැරීම කර ඇත.

[2] 2021 සහ 2022 පළාත් සඳහා ආංශික සැසඳීම් මෙම නිකුතුවේ ඇමුණුමේ දක්වා ඇත.

## පළාත් තුළ ආර්ථික කටයුතු

සෑම පළාතකම ආර්ථික කටයුතු සඳහා ප්‍රධානතම දායකත්වය සේවා අංශය විසින් ලබා දී ඇති අතර, දකුණු (සියයට 59.9) සහ බස්නාහිර (සියයට 58.5) පළාත් තුළ මෙම තත්ත්වය වඩාත් කැපී පෙනුණි. කර්මාන්ත කටයුතුවල දායකත්වය සලකා බැලීමේ දී බස්නාහිර පළාත (සියයට 34.4) ප්‍රමුඛ ස්ථානයේ පසුවන අතර, දෙවන ඉහළම දායකත්වය වයඹ පළාතෙන් (සියයට 32.0) වාර්තා විය. මේ අතර, අනෙකුත් පළාත්වලට සාපේක්ෂව නැගෙනහිර (සියයට 17.2) සහ ඌව (සියයට 15.5) පළාත්වල ආර්ථික කටයුතුවලට කෘෂිකර්මාන්තය වැඩි දායකත්වයක් වාර්තා කර ඇත.

**රූප සටහන 3**
**පළාත් තුළ ආර්ථික කටයුතු - 2022**



## සංඛ්‍යා සටහන 1
## පළාත් අනුව නාමික ද.දේ.නි. (පදනම් වර්ෂය 2015)

| පළාත | 2021[අ] | | 2022[ආ] | |
|---|---|---|---|---|
| | අගය (රු. මිලියන) | ප්‍රතිශතය (%) | අගය (රු. මිලියන) | ප්‍රතිශතය (%) |
| මධ්‍යම | 1,823,459 | 10.4 | 2,423,253 | 10.0 |
| නැගෙනහිර | 963,957 | 5.5 | 1,248,306 | 5.2 |
| උතුරු මැද | 878,248 | 5.0 | 1,209,771 | 5.0 |
| වයඹ | 1,955,294 | 11.1 | 2,706,227 | 11.2 |
| උතුරු | 752,276 | 4.3 | 985,139 | 4.1 |
| සබරගමුව | 1,269,383 | 7.2 | 1,725,853 | 7.1 |
| දකුණු | 1,614,660 | 9.2 | 2,199,791 | 9.1 |
| ඌව | 848,092 | 4.8 | 1,176,221 | 4.9 |
| බස්නාහිර | 7,494,822 | 42.6 | 10,473,166 | 43.4 |
| **ශ්‍රී ලංකාව** | **17,600,191** | **100.0** | **24,147,726** | **100.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

*මූලයන්:* ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සංඛ්‍යා සටහන 2
## පළාත් අනුව නාමික ද.දේ.නියෙහි ආංශික සංයුතිය - 2021 සහ 2022

| පළාත | කෘෂිකර්මාන්ත (%) | | කර්මාන්ත (%) | | සේවා (%) | |
|---|---|---|---|---|---|---|
| | 2021[අ] | 2022[ආ] | 2021[අ] | 2022[ආ] | 2021[අ] | 2022[ආ] |
| මධ්‍යම | 13.6 | 13.7 | 9.9 | 9.1 | 10.1 | 10.0 |
| නැගෙනහිර | 8.9 | 10.2 | 5.1 | 4.2 | 5.1 | 4.9 |
| උතුරු මැද | 10.5 | 8.4 | 3.6 | 4.2 | 4.9 | 4.9 |
| වයඹ | 17.4 | 18.3 | 11.8 | 11.8 | 9.7 | 9.8 |
| උතුරු | 7.2 | 6.2 | 4.2 | 4.3 | 3.9 | 3.6 |
| සබරගමුව | 8.2 | 8.7 | 7.1 | 6.7 | 7.1 | 7.1 |
| දකුණු | 15.5 | 14.6 | 6.4 | 6.4 | 9.6 | 9.7 |
| ඌව | 8.5 | 8.6 | 4.1 | 4.0 | 4.6 | 4.7 |
| බස්නාහිර | 10.2 | 11.4 | 47.8 | 49.2 | 44.9 | 45.2 |
| **ශ්‍රී ලංකාව** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

*මූලයන්:* ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව